ලංකාදීප සුව + සෙවණ

# ඩෙංගු-03

## අලුත්ම ප්‍රබේදයක්

**ඒන්නත්කරණය මගින් කොවිඩ් ව්‍යාප්තිය බොහෝ දුරකට මැඩපැවැත්වීමට හැකි වුවද මෙසමයෙහිම ඩෙංගු රෝගයද දිවයින පුරා වරින් වර හිස ඔසවනු දැක ගත හැකිය. කොවිඩ් ව්‍යාප්තිය හමුවේ රාජ්‍ය සහ පෞද්ගලික අංශ සේවකයන් නිවසට වී වැඩ කිරීමේ ක්‍රමවේදය ඇරැඹීමත් සමග ඩෙංගු ව්‍යාප්තියේද මන්දගාමී භාවයක් පෙන්නුම් කෙරිණි. එහෙත් වර්තමානය වනවිට කොවිඩ් සේම වාර්තා වෙන ඩෙංගු රෝගීන්ගේ සංඛ්‍යාවද ඉහළ යමින් පවතී. ඒ ඩෙංගු -03 යන නව ප්‍රභේදයක්ද සමගිනි.**

- පැතිරීම වේගවත්
- නිරන්තර සෝදිසියෙන් සිටින්න



- හිතුමතේ බෙහෙත් ගත්තොත් ලෙඩේ අවදානම්
- කලින් හැදුනත් යළි හැදෙන්න පුළුවන්
- කොරෝනා ලක්ෂණවලට ඩෙංගු ලක්ෂණත් සමාන නිසා අවදානම වැඩියි

ඩෙංගු රෝගය - I, II,III සහ IV යනුවෙන් ප්‍රභේද සතරකි. මුල් කාලයේදී මෙරටේ ඩෙංගු -01 පැතිර ගිය අතර 2017 වනවිට ඩෙංගු -02 ප්‍රභේදයේ ව්‍යාප්තිය ඇරැඹිණි. අද වනවිට ඩෙංගු -02 ප්‍රභේදය සමගම නව ප්‍රභේදය වන ඩෙංගු -03හිද පැතිරීම වේගවත් වී ඇත. එය ප්‍රතිශතයක් ලෙස දැක්වුවහොත් ඩෙංගු -02 ප්‍රභේදය සියයට හතළිස් එකක් වනවිට නව ප්‍රභේදය සියයට තිස් නවයක් තරම් වේගවත්ව පැතිරීම සිදුව ඇත..

මීට පෙරාතුව ඩෙංගු වැළඳුණු පුද්ගලයකුට වුවද නැවත වතාවක් රෝගය වැළඳිය හැකි අතර රෝගියාගේ තත්ත්වය බරපතළ විය හැකිය. අනෙක් ඩෙංගු ප්‍රභේද මෙන් නොව මෙහි වේගවත් ව්‍යාප්තිය හමුවේ රෝග ලක්ෂණ ඉතා ඉක්මනින් මතුවිය හැකිය. මේ වනවිට දිවයින පුරාම ඩෙංගු අවදානම ඇති අතර නව ප්‍රභේදය වාර්තා වී ඇත්තේ කොළඹ නගර සභා බල ප්‍රදේශයත්, ගම්පහ දිස්ත්‍රික්කයෙනුත්ය. නව ප්‍රභේදය ඇතුළුව සියලුම ඩෙංගු රෝගීන් සතියකට 50ක් 60ත් අතර සංඛ්‍යාවක් ළමා රෝහලට වාර්තා වෙන අතර වරකට රෝගීන් 30කට ආසන්නවද හමුවන අවස්ථා ඇත.



ඉදිරියේදී ලංකාව පුරාම නව ප්‍රභේදය ව්‍යාප්තව යාමේ අවදානමක් පවතින බැවින් කුඩා දරුවන් සේම වැඩිහිටි සියලුම දෙනා අවධානයෙන් පසුවිය යුතුය. එසේම මේ දිනවලදී පුද්ගලයකු උණ තත්ත්වයෙන් පෙළේ නම් තමන් විසින් රෝග විනිශ්චය කිරීමට යාමෙන් වැළකිය යුතුය. මෙබඳු විටෙකදී නිවැරැදිම රෝග විනිශ්චය අත්‍යවශ්‍ය බව සලකන්න.

ඩෙංගු රෝගයේ ලක්ෂණද බෙහෙවින්ම කොවිඩ් රෝග ලක්ෂණවලට සමාන වේ. යම් පුද්ගලයකුට දින 03ට වඩා උණ පවතී නම් කොවිඩ්ද, ඩෙංගුද නොඑසේ නම් වෙනත් වයිරස් උණ තත්ත්වයක්ද යන්න පැහැදිලි රෝග විනිශ්චයක් අවශ්‍යම වේ. මෙහිදී සම්පූර්ණ රුධිර පරීක්ෂාවක් සිදුකර ගත යුතුය.

උණ ගතියට අමතරව හිසරදය, ඇස් යට කැක්කුම, බඩේ දකුණු පසට වන්නට (අක්මාව ඇති ප්‍රදේශයේ) හට ගන්නා කැක්කුම, හන්දිපත් වේදනාව, මස් පිඩුවල වේදනාව වැනි සාමාන්‍ය ඩෙංගු රෝගයේම ලක්ෂණ ඇති වේ.

ඩෙංගු සඳහා තවමත් ප්‍රතිශක්තිකරණයක් සොයාගෙන නැති නිසා වැළඳුණු මුල් අවස්ථාවේදීම හඳුනා ගැනීමෙන් අතුරු ආබාධ වළක්වා ගත හැකිය. එනම් ඩෙංගු රක්තපාතය, කම්පන වැනි දරුණු සංකූලතා දක්වා තත්ත්වය දරුණු වීම වළක්වා ගත හැකිය.

උණ ගතිය පවතී නම් පැරසිටමෝල් හැරෙන්න කිසිදු ඖෂධයක් හිතුමතයට ලබා ගැනීමෙන් වළකින්න. පැරසිටමෝල් වුවද භාවිත කළ යුත්තේ නිසි මාත්‍රාව නියමිත පරිදිය. ඩෙංගු රෝගයට පැරසිටමෝල් හැර වෙනත් ඖෂධ වෛද්‍ය නිර්දේශයෙන් පරිබාහිරව ලබා ගැනීමෙන් වළකින්න. එසේ නොවුණහොත් බාහිරව ලබා ගන්නා ඖෂධවල ක්‍රියාකාරීත්වය මත ඩෙංගු සංකූලතා වැඩි වීමට පුළුවන.

ඩෙංගු වැළඳී ඇතිබවට තහවුරු වූ පසුව රෝගියාට හොඳ විවේකයක් ලබා දිය යුතුය. එය ඉතාම වැදගත් සාධකය වේ. එවගේම රෝගියාගේ සුවතාව සඳහා හොඳින් දියර වර්ග ලබා දිය යුතු අතර ඒ කිසිදු විටෙකදී රතු සහ කලු පැහැති ආහාර පාන ලබා නොදීමටත් වගබලා ගත යුතුය. මන්ද ඩෙංගු රක්තපාත තත්ත්වය දක්වා වර්ධනය වුවහොත් නිවැරැදිව රෝග තත්ත්වය නිශ්චය කර ගැනීම අපහසු නිසාය.



බොරැල්ල රිජ්වේ ආර්යා ළමා රෝහලේ ළමා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය **දීපාල් පෙරේරා**

ඩෙංගු රෝගය පතුරුවන 'Aedes aegypti ' සහ 'Aedes albopictus' යන මදුරු විශේෂවල බෝවීමද ශීඝ්‍රයෙන් සිදුවේ. උදෑසන 6ත් 11ත් සහ සවස 3.30ත් 6.30ත් අතර කාලය මෙම මදුරු විශේෂ සක්‍රීයව දෂ්ටනයේ යෙදෙන අතර දවසේ අනෙක් කාලවලදීද සිටිය හැකිය. තවමත් වසංගත තත්ත්වය මුළුමනින්ම පහව ගොස් නැති බැවින් සියලුම දෙනා ඩෙංගු අවදානම ඉදිරියේදීද වගකීමෙන් කටයුතු කළ යුතුය.

තම නිවස මෙන්ම පාසල සහ රැකියා පරිශ්‍රය අසලත් මදුරුවන් බෝවීමට හැකි ස්ථාන සොයා බලා විනාශ කිරීමෙන් ඩෙංගු පැතිරීම පාලනය කර ගැනීමට පහසු වේ. තවද විශේෂයෙන් මේ සතියේදී පාසල්ද සාමාන්‍යකරණය වීම තුළ දරුවන් පාසල් යැවීමේදී අත් පාවල පැඟිරි තෙල් හෝ මදුරු විකර්ශක ආලේපනය දෛනික පුරුදු අතරට එකතු කර ගත හැකිය.

සාමාන්‍යයෙන් වසංගත කාලයකදී විවිධ ලෙඩ රෝග වරින් වර මතු වීමේ අවදානමක් පවතින බැවින් නිරන්තර සෝදිසිය, විමසිලිමත්භාවය සහ පරෙස්සමට මුල්තැන දීමෙන් සියලු දෙනාගේම ජීවිත සුරක්ෂිතතාව තහවුරු කර ගත හැකි වනු ඇත.

සටහන- **මාධවී ධර්මරත්න**